# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2126/12 - 2019 ජූනි මස 03 වැනි සඳුදා - 2019.06.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වන ව්‍යවස්ථාව සමග කියවිය යුතු වරින් වර සංශෝධිත 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27අ(1) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මා විසින් මේ නියමය මගින්,

1. ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ පිහිටුවන ලද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත එකී පනතේ තුන්වන වගන්තිය ප්‍රකාරව සතුවී ඇත්තා වූ ද මේ නියමයේ උපලේඛන මගින් නිශ්චිතව දක්වා ඇති කෘෂිකාර්මික ඉඩම්, එකී ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 22(1)ආ වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කාර්යයන් සඳහා 1978 අංක 4 දරන පනත මගින් පිහිටුවා ඇති ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත විකිණීමෙන් පවරා දෙනු ලැබේ.

(අ) අපනයන සැකසුම් කලාපයක්/කර්මාන්ත පුරයක් පවත්වාගෙන යාමට අවශ්‍ය යටිතල පහසුකම් සහ සේවක නිවාස ඉදිකිරීමට,

(ආ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මඟින් අනුමත කර ආයෝජන ව්‍යාපෘති සඳහා ඉඩම අතුරු බදු දීම සහ ආයෝජන මණ්ඩලයේ අවශ්‍යතාවය අනුව අවසතු කිරීමට,

2. ඉහත කී විකිණීම සඳහා මුළු ප්‍රතිෂ්ඨාව වශයෙන් රුපියල් 112,000,000.00 (රුපියල් මිලියන එකසිය දොළහක්) ක මුදල පහත උපලේඛනගත ඉඩම් වෙනුවෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ගෙවීමට එකඟ වී ඇත.

| *උපලේඛන* | *ඉඩමේ නම* | *ප්‍රමාණය* *අක්.* | *:රූඩ්* | *: පර්.* | *පිඹුරු අංකය* |
|---|---|---|---|---|---|
| අංක 1 | වතු වත්ත හෙවත් ජර්මන් වත්ත | 157 | 3 | 12.29 | 1655 |
| අංක 2 | ගොරකගස් අගාර හෙවත් කොවුල් වැව වත්ත | 282 | 3 | 0.38 | 1659 |

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2019 මැයි මස 31 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1 වන උපලේඛනය - වතු වත්ත හෙවත් ජර්මන් වත්ත

ඉඩමේ විස්තරය : වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වතු වත්ත සහ දොරළුඹ ගමේ පිහිටි වතු වත්ත හෙවත් ජර්මන් වත්ත නමැති ඉඩම විශේෂ අංක කො/309 යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇත. මෙම ඉඩමට අදාල බලයලත් මිනින්දෝරු බී. එස්. අලහකෝන් මහතා විසින් 2000.10.13 දිනැතිව පිළියෙල කරන ලද අංක 1655 දරන පිඹුරෙහි පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණ වලින් යුත් ඉඩම් කැබලි වලට මායිම්ව.

**(01) කැබලි අංක 01 ප්‍රමාණය අක්කර 16, රූඩ් 2, පර්චස් 2.64 (හෙක්ටයාර් 6.684)**

| | | |
|---|---|---|
| *උතුරට* | : | කේ. ඒ. ඔමරියා විසින් භුක්ති විදින කුඹුර සහ ඉඩම, |
| *නැගෙනහිරට* | : | මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය, |
| *දකුණට* | : | මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය සහ කැබලි අංක 4, |
| *බස්නාහිරට* | : | කැබලි අංක 4 සහ කේ. ඒ. ඔමරියා විසින් භුක්ති විදින කුඹුරු ඉඩම. |

**(02) කැබලි අංක 02 ප්‍රමාණය අක්කර 1, රූඩ් 1, පර්චස් 36.04 (හෙක්ටයාර් 0.597)**

| | | |
|---|---|---|
| *උතුරට* | : | මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය, |
| *නැගෙනහිරට* | : | ආර්. එම්. ඩී. රත්නායකට හිමි ඉඩම, |
| *දකුණට* | : | ආර්. එම්. ඩී. රත්නායකට හිමි ඉඩම සහ කුඹුරු ඉඩම් සහ කැබලි අංක 3, |
| *බස්නාහිරට* | : | කැබලි අංක 3 සහ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය. |

**(03) කැබලි අංක 03 ප්‍රමාණය අක්කර 7, රූඩ් 3, පර්චස් 5.81 (හෙක්ටයාර් 3.151)**

| | | |
|---|---|---|
| *උතුරට* | : | මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය, කැබලි අංක 2 සහ ආර්. එම්. ඩී. රත්නායක හිමිකම් කියන කුඹුරු ඉඩම |
| *නැගෙනහිරට* | : | ආර්. එම්. ඩී. රත්නායකට හිමි කුඹුරු ඉඩම සහ හෙට්ටියාකොටුව පොදු සුසාන භූමිය, |
| *දකුණට* | : | හෙට්ටියාකොටුව පොදු සුසාන භූමිය සහ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය, |
| *බස්නාහිරට* | : | මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය. |

**(04) කැබලි අංක 04 ප්‍රමාණය අක්කර 51, රූඩ් 3, පර්චස් 12.95 (හෙක්ටයාර් 20.955)**

| | | |
|---|---|---|
| *උතුරට* | : | වතු වත්ත පන්සල් ඉඩම, කිරිමැටිවල ඇළ, එල්. පී. ඒ. ආර්. රත්නායකට හිමි කුඹුර, කේ. ඒ. ඔමරියාට හිමි කුඹුරු ඉඩම සහ කැබලි අංක 1 |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 1 සහ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය, |
| *දකුණට* | : | මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය, |
| *බස්නාහිරට* | : | වතු වත්ත මහා විද්‍යාලයට අයත් ඉඩම, ප්‍රාදේශීය සභා මාර්ගය, වතු වත්ත පන්සල පිහිටි ඉඩම සහ එල්. පී. ඒ. ආර්. රත්නායකට හිමි කුඹුර, |

**(05) කැබලි අංක 05 ප්‍රමාණය අක්කර 41, රූඩ් 1, පර්චස් 24.40 (හෙක්ටයාර් 16.755)**

| | | |
|---|---|---|
| *උතුරට* | : | මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය, |
| *නැගෙනහිරට* | : | ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගය සහ ආර්. ඒ. ධර්මසේනට හිමි කුඹුරු ඉඩම, |
| *දකුණට* | : | මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය, |
| *බස්නාහිරට* | : | මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය. |

**(06) කැබලි අංක 06 ප්‍රමාණය අක්කර 38, රූඩ් 3, පර්චස් 10.45 (හෙක්ටයාර් 15.708)**

| | | |
|---|---|---|
| *උතුරට* | : | මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය, |
| *නැගෙනහිරට* | : | එල්. එන්. පෙරේරා හිමිකම් කියන ඉඩම සහ එල්. ඒ. පෙරේරා සහ තවත් අය හිමිකම් කියන ඉඩම, |
| *දකුණට* | : | රොමේෂ් සහ තවත් අය හිමිකම් කියන ඉඩම, ජේ. බාලසූරිය හිමිකම් කියන ඉඩම, ආර්. එම්. සේනාරත්න සහ තවත් අය හිමිකම් කියන ඉඩම සහ ආරියපාල සහ තවත් අය හිමිකම් කියන ඉඩම, |
| *බස්නාහිරට* | : | මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය. |

**2 වන උපලේඛනය** - ගොරකගස් අගාර හෙවත් කොවුල් වැව වත්ත

*ඉඩමේ විස්තරය :* වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගොරකගස් අගාර, මරක්කල මුල්ල සහ හබර වැව ගමේ පිහිටි විශේෂ අංක කො/2472 යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු වූ කොවුල් වැව එස්ටේට්, ගොරකේ කුඹුර සහ කොවුල් වැව වත්ත නමැති ඉඩමට අදල බලයලත් මිනින්දෝරු බි. එස්. අලහකෝන් මහතා විසින් 2000.11.10 දිනැතිව පිළියෙල කරන ලද අංක 1659 දරන පිඹුරෙහි පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණ වලින් යුත් ඉඩම් කැබිලි වලට මායිම්ව.

**(01) කැබලි අංක 01 ප්‍රමාණය අක්කර 227, රූඩ් 2, පර්චස් 13.02 (හෙක්ටයාර් 92.0989)**

*උතුරට* : ඒ. පෙරේරා හිමිකම් කියන ඉඩම, ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගය, ඩබ්ලිව්. ඒ. ප්‍රනාන්දු සහ තවත් අය හිමිකම් කියන ඉඩම, සහ ජී. ඒ. ඒ. පෙරේරා හිමිකම් කියන ඉඩම.

*නැගෙනහිරට* : ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගය, මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය, ආර්. එම්. ඇලිස්නෝනා හිමිකම් කියන ඉඩම, කේ. ඒ. පැන්ටලින් හිමිකම් කියන ඉඩම, ඇලෝසියස් හිමිකම් කියන ඉඩම, ආර්. ආර්. ප්‍රනාන්දු සහ තවත් අය හිමිකම් කියන ඉඩම, ඩබ්ලිව්. ආර්. ඒ. ප්‍රනාන්දුට හිමි ඉඩම, ස්ප්‍රිනා හිමිකම් කියන ඉඩම සහ ඩබ්ලිව්. රන්දෙනිය හිමිකම් කියන ඉඩම.

*දකුණට* : මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය, එම්. ආර්. ඇලිස්නෝනාට හිමි ඉඩම, කේ. ඒ. පැන්ටලින්ට හිමි ඉඩම, ඇලෝසියස් හිමිකම් කියන ඉඩම, ඩබ්ලිව්. රන්දෙනියට හිමි ඉඩම, ටී. එච්ටොස් නෝනාට හිමි ඉඩම, පී. පී. සුනිල් හිමිකම් කියන ඉඩම, එල්. එම්. සකීන් හිමිකම් කියන ඉඩම, ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගය එස්. රන්දෙනිය සහ තවත් අය හිමිකම් කියන ඉඩම, කේ. ඒ. ආතර් සිංඤෝ හිමිකම් කියන ඉඩම, කේ. ඒ. මැණික් හාමි හිමිකම් කියන ඉඩම, ඒ. රන්දෙනිය හිමිකම් කියන ඉඩම.

*බස්නාහිරට* : ප්‍රාදේශීය සභා මාර්ගය, එස්. රන්දෙනිය සහ තවත් අය හිමිකම් කියන ඉඩම, කේ. ඒ. ආතර්සිංඤෝ හිමිකම් කියන ඉඩම, කේ. ඒ. මැණික් හාමි හිමිකම් කියන ඉඩම, ඒ. රන්දෙනිය හිමිකම් කියන ඉඩම, ජී. ඒ. ඒ. පෙරේරා හිමිකම් කියන ඉඩම සහ ඩබ්ලිව් ආර්. ඒ. ප්‍රනාන්දු සහ තවත් අය හිමිකම් කියන ඉඩම.

**(02) කැබලි අංක 02 ප්‍රමාණය අක්කර 55, රූඩ් 0, පර්චස් 27.36 (හෙක්ටයාර් 22.3269)**

*උතුරට* : ඒ. ගුණසේකරට හිමි කුඹුරු ඉඩම, ඩබ්ලිව්. ඒ. තිලකාවතීට හිමි ඉඩම, මාර්ගය, ටී. එච්. එම්. ඩී. ආර්. පීරිස් සහ තවත් අය හිමිකම් කියන ඉඩම සහ ඩබ්ලිව්. ඒ. කේ. ප්‍රේමලතා සහ තවත් අය හිමිකම් කියන ඉඩම,

*නැගෙනහිරට* : මාර්ගය, ටී. එච්. එම්. ඩී. ආර්. පීරිස් සහ තවත් අය හිමිකම් කියන ඉඩම, ඩබ්ලිව්. ඒ. කේ. ප්‍රේමලතා සහ තවත් අය හිමිකම් කියන ඉඩම, ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගය, ඊ. යූ. ගමගේ හිමිකම් කියන ඉඩම, කේ. ඒ. එල්. බැසිල් සහ තවත් අය හිමිකම් කියන ඉඩම, ඩබ්ලිව්. පී. ෆොන්සේකා හිමිකම් කියන ඉඩම, තවලේ පන්සල පිහිටි ඉඩම, ඩබ්ලිව්. ඒ. ප්‍රනාන්දු හිමිකම් කියන ඉඩම සහ පී. ඩබ්ලිව්. සිරියාවතී හිමිකම් කියන ඉඩම, ඩබ්ලිව්. සී. ප්‍රනාන්දු හිමිකම් කියන ඉඩම සහ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය,

*දකුණට* : ඊ. යූ. ගමගේ හිමිකම් කියන ඉඩම, කේ. ඒ. බැසිල් සහ තවත් අය හිමිකම් කියන ඉඩම, ඩබ්ලිව්. පී. ඩබ්ලිව්. ෆොන්සේකා හිමිකම් කියන ඉඩම, තවලේ පන්සල පිහිටි ඉඩම, ඩබ්ලිව්. ඒ. ප්‍රනාන්දු හිමිකම් කියන ඉඩම, පී. ඩබ්ලිව් සිරියාවතී හිමිකම් කියන ඉඩම, ඩබ්ලිව්. සී. ප්‍රනාන්දු හිමිකම් කියන ඉඩම, මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය සහ ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගය.

*බස්නාහිරට* : ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගය.

06 - 521